www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ප්‍රචන්ඩ තර්ජන නතර කරන ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකාවේ සසප ජවිපෙ වෙත යැවූ ලිපිය

## Sri Lankan SEP letter to JVP demanding end to threats of violence

**2007 අගෝස්තු 28**

*පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ දී සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සංවිධානයට එරෙහිව එල්ල කෙරෙන ප්‍රචන්ඩ තර්ජන නතර කරන ලෙස ඉල්ලමින් ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) විසින් පහත ලිපිය ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වෙත යවන ලදි. මෙම සිද්ධිය පිලිබඳ පූර්න වාර්තාවක් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය. (බලන්න: ශ්‍රී ලංකාව: ජවිපෙ ශිෂ්‍ය නායකයා සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ව්‍යාපාරයේ විශ්වවිද්‍යාල කන්ඩායමට කායික තර්ජන එල්ල කරයි)*

ටිල්වින් සිල්වා මයා,

ලේකම්, ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ)

මා ඔබ වෙත මෙම ලිපිය ලියන්නේ අගෝස්තු 7 දා පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සංවිධානයේ සාමාජිකයන්ට එරෙහිව ඔබගේ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලයට (අවිශිබම) අයත් සිසුන් විසින් කරන ලද ප්‍රචන්ඩ තර්ජන සම්බන්ධයෙනි.

මෙම සිද්ධිය සිදු වූයේ සසප හා සසජාශි සාමාජිකයන් පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ සෙනෙට් ගොඩනැගිල්ල අසල පොත් ප්‍රදර්ශනයක් පවත්වමින් සහ ඉරාකයේ එක්සත් ජනපද මිලිටරි වාඩිලෑමට ද ශ්‍රී ලංකාවේ යලි ආරම්භ කර ඇති සිවිල් යුද්ධයට ද එරෙහිව ශිෂ්‍යයන් අතර උද්ඝෝෂනය කරමින් සිටිය දී ය. සසජාශි සිය උද්ඝෝෂනය පැවැත්වීම සඳහා විශ්වවිද්‍යාල බලධාරින්ගෙන් ලිඛිත අවසරයක් ඉල්ලා එය ලබා ගෙන තිබුනි.

උද්ඝෝෂනය පෙරට යද්දී, දුසිමකට වැඩි අවිශිබම සාමාජිකයන් කන්ඩායමක් අසල රැඳී පැය එකහමාරකට අධික කාලයක් එය නිරීක්ෂනය කරමින් සිටියේ ය. පෙ.ව. 10.30ට පමන චින්තක තුඩුවගේ, දුෂ්මන්ත අබේසිංහ සහ රංගන ජයකොඩි ඇතුලු ශිෂ්‍ය නායකයන් කිහිප දෙනෙක් -- ඔවුන් සියලු දෙනාම අවිශිබම සාමාජිකයෝ ය -- පොත් මේසය කරා පැමින එය සංවිධානය කර ඇත්තේ කාගේ අවසරයක් මත ද යන වග විමසී ය.

පිලිතුරු වසයෙන්, විශ්වවිද්‍යාල ලේඛකාධිවරයාගේ අවසරය ගැන පැවසූ කල චින්තක සාවද්‍ය ලෙස කියාපෑවේ සසජාශි සංවිධානයට පොත් ප්‍රදර්ශනය කිරීමට මිස සිසුන් අතර "උද්ඝෝෂනය" කිරීමට අවසර නැති බව යි. "වහාම අකුලා ගෙන යන" ලෙසටත් නැත හොත් "තත්වය වඩා නරක් වනු" ඇති බවටත් ඔහු සසජාශි හා සසප සාමාජිකයන්ට අන කලේ ය. ඔහු කරන්නේ තර්ජනයක් දැයි විමසූ කල චින්තක මෙසේ පුරසාරම් දෙඩී ය: "ඔව්, තර්ජනයක් තමයි. අපට තර්ජනය කරන්න බැරි ද? ඕගොල්ල නොගියොත් අපි ඕගොල්ල බලහත්කාරයෙන් යවනවා." එක් නිශ්චිත සසජාශි සාමාජිකයකු ගැන සඳහන් කල ඔහු මෙසේ ද අනතුරු ඇඟවී ය: "එයා මේ විශ්වවිද්‍යාලයට ආයිත් ආවොත් අපි එයාට ගහනවා."

මෙම තර්ජන කිසිසේත් ම ඉවසිය නොහැකි ය. සසපට ඒවා බැරෑරුම් ලෙස ගැනීමට සිදු වේ. ඔබ දන්නා පරිදි, 1989-1990 කාල පරිච්ඡේදයේ දී කල මෙවන් තර්ජනවලින් පසුව අපගේ සාමාජිකයන් තිදෙනෙක් -- ආර්.ඒ. පිටවෙල, පී.එච්. ගුනපාල සහ ග්‍රේෂන් ගීකියනගේ යන සහෝදරවරු -- ජවිපෙ සාමාජිකයන් විසින් ඝාතනය කරන ලදි.

අප තීරනය කරන්නේ චින්තක තුඩුවගේ, දුෂ්මන්ත අබේසිංහ සහ රංගන ජයකොඩි යන අය අවිශිබම සාමාජිකයන් ලෙස ඔබගේ සංවිධානයේ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන බව යි. ඔවුන්ව හික්මවා ගැනීම, ලේකම් ලෙස, ඔබගේ වගකීම යි. එවන් තර්ජන යලිත් එල්ල වුව හොත්, ඔබ ඒ සම්බන්ධයෙන් දේශපාලනිකව හා නෛතිකව වගකිව යුතු ය.

විජේ ඩයස්,

ප්‍රධාන ලේකම්,

සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව)

© www.wsws.org